# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1878/3 - 2014 සැප්තැම්බර් මස 01 වැනි සඳුදා - 2014.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත

5 වැනි වගන්තිය යටතේ නියෝගය

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ පනවන ලද අවසන් වරට සංශෝධනය කරන ලද 2012 ඔක්තෝබර් 04 දිනැති අංක 1778/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් නියෝගය (2006 ඔක්තෝබර් 05 දිනැති අංක 1465/20 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් පළ කරන ලද) මේ සමග ඇති උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 01 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය.

#### උපලේඛනය

1. (i) 2012 අප්‍රේල් 04 දිනැති *අංක 1752/17 දරන අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් පළ කරන ලද 27 වන අයිතමය, 29 වන අයිතමය ලෙස ;

   (ii) 2012 මැයි 09 දිනැති *අංක 1757/4 දරන අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් පළ කරන ලද 28 වන අයිතමය, 30 වන අයිතමය ලෙස ;

   (iii) 2012 ඔක්තෝබර් 04 දිනැති *අංක 1778/32 දරන අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් පළ කරන ලද 29 වන අයිතමය, 31 වන අයිතමය ලෙසත්,

   යළි අංකනය කිරීම ; සහ

2. 31 වන අයිතමයට ඉක්බිතිවම පහත සඳහන් නව අයිතමය එකතු කිරීමෙන් :

   "32. 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වැනි වගන්තිය මගින් නියම කෙරෙන පරිදි අදාළ නව සමාගම් යටතේ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුත්තක් සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුත්තක් වෙනම සමාගම් දෙකකට වෙන්කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, රක්ෂණ සමාගමක පවතින කොටස්වලට හිලව් වශයෙන් එම කොටස්කරුවනට, පවත්නා කොටස් සංඛ්‍යාවේ අගය නොඉක්මවන පරිදි නිකුත් කරනු ලබන කොටස් නිකුතුවක් සම්බන්ධයෙන් වන කොටස් සහතිකය.".

10 - 643


1A - PG 2177 — 150 (2014/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*